*සැ. යු.*- 2019.03.01 දින පළ වූ අංක 2,113 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,114 - 2019 මාර්තු මස 08 වැනි සිකුරාදා - 2019.03.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 206 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 මාර්තු මස 29 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මාර්තු මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම කොළඹ පැවැත්වෙන බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණයේ දී ය (ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන)

සීමාසහිත සෙලාන් බැංකුව,
සෙලින්කෝ සෙලාන් ටවර්ස්,
අංක 90, ගාලු පාර, කොළඹ 03.

*නඩු අංකය* : H. C. Civil 251/2007(1) ............................*පැමිණිලිකරු.*

කුරුණෑගල දිසා අධිකරණ
ඇස්කීසි අංක : /2018

*එදිරිව*

1. අබ්දුල් හසන් මොහොමඩ් ෆයිරූස්
2. අබ්දුල් රහිම් නූර් නිශාම්

*දෙදෙනාම :*

අංක 86, වැලිකඩවත්ත,
පොල්ගහවෙල,

*සහ*

අංක 113, මහවීදිය,
මාවනැල්ල.

3. අබ්දුල් වහිඩ් මොහොමඩ් මුක්තාර්,
අංක 210, කෑගල්ල පාර, පොල්ගහවෙල.

............................*විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ 2013.10.08 වැනි දින ඇතුලත ලද නඩු තීන්දුව අනුව මා වෙත නිකුත් කර ඇති දේපල තහනමට ගෙන විකිණීමේ ඇස්කීසියේ බලය පිට පැමිණිලිකාර බැංකුවට අයවිය යුතු රු. 6,411,927.11 ක මුදලක් හා ඒ මත 2000.05.01 දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා සහ ඉන්පසු සම්පූර්ණයෙන් පැමිණිලිකරුට ගෙවා නිමකරන තෙක් තීන්දු ප්‍රකාශයේ සඳහන් මුදල මත 30% වාර්ෂික පොළියක්ද, අධිකරණයේ නිළධාරියෙකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට නියෝග කොට ඇති හෙයින් ද, ඒ අනුව ඉහත නම් සඳහන් 1 වන සහ 3 වන විත්තිකරුවන්ට අයත් මා විසින් දැනටමත් තහනමට ගන්නා ලද පහත උපලේඛනයේ සඳහන් වන දේපළ පිස්කල් වෙන්දේසියේ විකුණා පැමිණිලිකාර බැංකුවට අයකර දීම සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපල,

වර්ෂ 2019 ක් වූ මාර්තු මස 28 වැනි දින ප.ව. 1.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ උඩපොල ඕතට කෝරලේ, ගල්බොඩගම පිහිටි උතුරට : ලපය යද්දෙස්සාට අයත් ඉඩමද, නැගෙනහිරට : හොරතලාගේ හේනද, දකුණට : මුතුවාගේ ගෙඩිගල්හේන සහ කඳුරු පඳුර ද, බස්නාහිරට : උන්ගගේ හේන සහ කඳුරු ගහ ද යන මායිම් තුළ කුරහන් ලාස් දෙකක වපසරිය ඇති කජු ගහමුල හේන නමැති ඉඩමේ නොබෙදූ තුන්සිය හැටෙන් දෙසිය හතලිස් එක පංගුවෙන් නොබෙදූ තුනෙන් එක පංගුව (නොබෙදූ 241/360 න් 1/3 වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F/1034/244 යන වෙළුම්/පත්තිරු යටතේ ලියාපදිංචි වී ඇත.

*දේපළට ප්‍රවේශ මාර්ගය.-* පොල්ගහවෙල හංදියේ සිට දුම්රියපොල පාරෙන් මීටර් 200 ක් ගියවිට වම් පසින් වන්නට නගර සභා ක්‍රීඩා පිටිය හමුවේ. එය අසලින් ඇති පාරෙන් මීටර් 500 ක් ගොස් දකුණට හැරී තවත් මීටර් 400 ක් පමණ ගියවිට දකුණු දෙසින් වන්නට මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

(1) ගැණුම් මිලෙන් 25%,
(2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
(3) ප්‍රචාරණ වියදම්.

ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරියද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත කුරුණෑගල දිසා අධිකරණයේ ඉහත අංක දරන ඇස්කිසි අංකය යටතේ බැර කළ යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාල සීමාව ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. කළමණාකරු - සෙලාන් බැන්ක්, මාවනැල්ල ශාඛාව.

ටී. එන්. කුලසේකර,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය. කුරුණෑගල.

03-680